
# අසිරිමත් සිංහරාජය



ජයලි තරුල්‍යා චන්ද්‍රසිරි

# අසිරිමත් සිංහරාජ්‍ය

## ජයලි තරුල්‍යා චන්ද්‍රසිරි

කතෘගේ වෙනත් කෘති

- අහංකාර සරුංගලය
- දැඟකාර හා පුංචා
- ආදරණීය පූස් පැටියා
- උඩ අහසේ චාරිකාව

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය
7- G ශ්‍රේණිය
2026/06/16
ISBN – 978-624-211-466-B

# පිදුම

පළමු ශ්‍රේණියේ සිට මා හට සිප් සතර කියා දෙමින් ගුණ ගරුක දියණියක් වන්නට ඔවදන් ලබා දුන් සියලු ගුරු මෑණිවරුන්ටත් ගුරු පියවරුන්ටත් ගරු විදුහල්පතිතුමියටත් මහාමායා විදු මෑණියන්ටත් ආදරණීය දෙමාපියන්ටත් මේ පොත සෙනෙහසින් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# අසිරිමත් සිංහරාජය

නෙතුක  පුංචි ළමයෙක්. එයාට හරියටම අවුරුදු 10 යි. එයා ගහකොළවලට හරිම ආදරෙයි. චොක්ලට් කොළ, ෂොපින් බෑග්, ප්ලාස්ටික් වතුර බෝතල් වැනි දේවල් තැන තැන දාන්නේ නෑ. කුණු හැමතැනම දාලා තියනවා දැක්කොත් ඒවා නිවැරදි කසළ බඳුන් වලට දමනවා. පාසලේ දී පවා පන්ති කාමරය හා ඒ අවට අතුගා පිරිසිදු කරනවා. පාසලේ ඉන්න යාහළුවෝ වගේම ගුරුවරුත් නෙතුකට හරිම ආදරෙයි. පාසල ඉවර වෙලා ගෙදර වැඩ කරළා, අම්මාට උදවු කරළා. ගෙදර ලඟ තිබුණු ගඟ අසල උගුරැස්ස ගස යට ඉඳගෙන ගස් වැල් සුළඟට වැනෙන හඬ අහගෙන ඉන්නවා, කුරුල්ලන්ගේ මිහිරි නාද අහගෙන ඉන්නවා. මේක නෙතුකගේ විනෝදාංශය වුණා.



නෙතුකගේ ආනාගත බලාපොරොත්තුව වුණේ පරිසර වේදියෙක් වීමයි. ටික දවසකින් නෙතුකගේ පාසලේ පාසල් නිවාඩුව එළඹුනා. නෙතුකගේ අම්මා සහ තාත්තා නිවාඩුවට විනෝද චාරිකාවක් යාමට තීරණය කරමිනුයි හිටියේ. නෙතුක මිදුලට යාමට සූදානම් වුණා.


එවිට අම්මා,

''පුතේ නිවාඩුවට ඔයා කොහේද යන්න කැමති ?'' යැයි නෙතුකගෙන් ඇහුවා. නෙතුක ටිකක් කල්පනාකළා. ටික වෙලාවකින් නෙතුක,

''අම්මේ සිංහරාජ වනාන්තරය බලන්න යමු ද? මම හරිම කැමතියි සිංහරාජ වනාන්තරය බලන්න යන්න''. නෙතුක කිවුවා.


තාත්තාත් නෙතුක දෙස බලා සිනාසෙමින් ''එහෙනම් අපි ලබන සෙනසුරාදා සිංහරාජ වනාන්තරය බලන්න යමු'' තාත්තා කිවුවා. නෙතුකට හරිම සතුටුයි. එයා සිංහරාජ වනාන්තරයේ අසිරිය ගැන සිහින දකිමින් මිදුලේ දුව පැන නැටුවා.

ඔන්න ඔහොම එදා දවසත් ගතවුණා.



තවත් දින කිහිපයක් ගෙවී ගියා. දැන්නම් දවස් ගෙවෙන්නේ ගොඩක් හෙමින් බවයි නෙතුකට හැඟුනේ. තාත්තාගෙන් සිංහරාජ වනාන්තරයට යන මාර්ග සිතියමකුත් ලැබුනා. ඒ දින කිහිපයම සිංහරාජ වනාන්තරය ගැන නෙතුක ගොඩාක් තොරතුරු සෙව්වා. ඒවා සියැසින් දැකගන්නා තුරු ගොඩක් නොඉවසිල්ලෙන් තමයි නෙතුක සිටියේ.

නෙතුක සිහින මැවූ දවස හෙටයි. නෙතුක නින්දට ගියත් එදින රාත්‍රියේ නෙතුකගේ ඇස් ලගටවත් නින්ද පැමිණියේ නැහැ. හෙට දින චාරිකාව සිහි කිරීම නෙතුකට බොහෝ රසවත් වුණා. නින්දත් සමග නෙතුක සටන් කර පැය කිහිපයක් නින්දට ජය ගන්නට ලැබුනත් හැමොටමත් කලින් අවදි වූයේ නෙතුකයි.



හැමෝම උදේ පාන්දරින්ම නෙතුකගේ තාත්තාගේ පුංචි කාර් රථයෙන් ගමනට පිටත් වුණා. පැය කිහිපයක් යන විට එයාලා රත්නපුරයට ලගා වුණා. ටිකෙන් ටික ගහ කොළ පිරුණු, පරිසරයම සිසිල් බවක් දැනෙන්නට වුණා.
''තාත්තේ, දැන් අපි සිංහරාජ වනාන්තරයට ළඟයි ද''?

''පුතා දන්නවාද, සිංහරාජ වනාන්තරය පිහිටලා තියන දිස්ත්‍රික්කය මොකක්ද කියලා''?

''රත්නපුර නේද තාත්තේ ''


''ඔව් පුතේ, හැබැයි සිංහරාජ වනාන්තරය දිස්ත්‍රික්ක තුනකට මායිම්ව තමයි පිහිටලා තියෙන්නේ, ඒ තමයි රත්නපුර, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්ක'' දැන්නම් හාත්පස ගහකොළවලින් බරවී තරමක අඳුරුඇස්වරූපයක් ගෙන චිත් ගතට අමුතුම සීතලක් දැනෙන්නට වුණා.



''පුතේ, මේ යන්නේ සිංහරාජ වනාන්තරයට ඇතුළු වන පිවිසීමේ දොරටුව දෙසටයි'' අම්මා කිව්වා. තාත්තා කුඩා රථ ගාලක කාර් රථය නැවැත්තුවා. නෙතුක ඉක්මනින් බිමට බැස අවට පරිසරයට නෙත් යොමා වට පිටාවම බැලුවා.

රූස්ස ගස්වැල්වලින් වට වී නිසොල්මන්ව බලා සිටිනවා වගේ නෙතුකට දැනුනා.

ටිකට් පත් ලබා ගෙන ගස්වැල් අතරින් සිංහරාජ වනාන්තරයට පිවිසීමේ කුඩා මාර්ගය දිගේ ඇතුළු වී ටික දුරක් යන විට එතන සිටිය මාමා කෙනෙක් සිංහරාජ වනාන්තරය ගැන විස්තර කියා දෙන්නට වුණා. නෙතුක ඒ දේවල් කුඩා පොතක සටහන් කර ගත්තා.



ලෝකයේ වැසි වනාන්තර වලින් ලංකාවේ සිංහරාජයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයක්. සිංහරාජ වනාන්තරය 1989 වසරේදී තමයි ලෝක උරුමයක් බවට පත් වුණේ. සිංහරාජය මැදින් ගිං ගඟ හා කළු ගඟ ගලා බසිනවා. ඒ වගේම මනස්කාන්ත සුන්දර දියඇලි රාශියකුත් සිංහරාජය හැඩ කරනවා. ඒ වගේම සිංහරාජයට ආවේණික ශාක හා සත්ව විශේෂ රාශියක් සිටිනවා. ඒ අතර, කුරුලු විශේෂ, උරග විශේෂ , කෘමීන් වර්ග , ක්ෂීරපායින් හා සමනලයින් වගේ අය ගොඩක් විශේෂයි. ඒ වගේම සිංහරාජය තුළ පමණක් දැකගත හැකි ගස් වැල් වර්ග බොහෝ ප්‍රමාණයක් තියනවා.

මේ සියලු දේවල් ගොඩක් ආසාවෙන් අහගෙන ලියා ගත්ත නෙතුක බොහොම උනන්දුවෙන් පරිසරය දෙස බලමින් තමා සිහින මැවූ සොබා දහමේ අසිරිය විඳින්නට කුඩා අඩිපාර දිගේ අම්මා ද තාත්තා ද මඟ කියාදෙන මාමා ද සමඟ සිංහරාජයට ඇතුළු වුණා.



නෙතුකට ලස්සන කුරුලු වර්ග, කටුස්සන් වර්ග ,සමනලයින් , උරග විශේෂ මෙන්ම මනස්කාන්ත තුරු ලතා ද කඳු බෑවුම් අතරින් ගල් තල අතරින් පෙන පිඬු නංවමින් රූටා වැටෙන දියඇලි ද දක්නට ලැබුණා. සොබාදහම මොනතරම් සුන්දර ද ? එය භාවනාවක් සේ විඳින්නට හැකි බව නෙතුකට දැනුණා.

එදින නෙතුකගෙ ජීවිතයේ ලස්සනම දවසක් වුණා. එසේම එය  අනාගතයට රැගෙන යන වටිනා සිහිවටනයක් ද වුණා. නෙතුකගෙ සතුටු මුහුණ බලා සිටි අම්මාටත් තාත්තාටත් ගොඩාක් සතුටුයි.

සිංහරාජය තුළ දක්නට ලැබුණු එක් පුවරුවක තිබූ එක් වදන් පෙළක් නෙතුකගේ සිතේ තදින් සටහන් වුණා.

" දිය දහර ගලන්නට ,  වන මල් පිපෙන්නට

කුරුල්ලන්ට ගී ගයන්නට , කියා දිය යුතු නැත.

එහෙත් සොබාදහම සුරකින්නට මිනිසාට

කියා දිය යුතුව ඇත."



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)